# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
# (SLBFE)
## (විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය)

විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත ආයතනයක් වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි පවත්නා සාමාන්‍යාධිකාරී තනතුර (HM2-3) පිරවීම සඳහා ක්‍රියාශීලී, ප්‍රගාමී අවශ්‍ය පරිදි සුදුසුකම්ලත් හා පළපුරුදු අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

සහ

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ පිළිගත් වෘත්තීය කළමනාකරණ ආයතනයක ආයතනික සාමාජිකත්වය,

සහ

ප්‍රථම උපාධිය ලබාදීමෙන් පසුව, සංස්ථාවක, මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක, සනාථ කළ සේවා වාර්තාවක් සමග ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ වසර 05 ක් ඇතුළත්ව, කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 20 ක පළපුරුද්ද,

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්,

සහ

අදාළ ක්ෂේත්‍රයේ Phd උපාධියක්,

සහ

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව, සංස්ථාවක, මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක, සනාථ කළ සේවා වාර්තාවක් සහ කළමනාකරණ පළපුරුද්ද ඇතුළත්ව අවම වශයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ වසර 05 ක පළපුරුද්ද.

**වැටුප් පරිමාණය** : HM 2-3 - රුපියල් (98,215-2,700 x 12 - 130,615)

**වයස** : අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය** : පත් කිරීමේ බලධාරියා විසින් පත් කරනු ලබන තේරීම් කමිටුවක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**පොදු කොන්දේසි :**

- පත් කිරීම ස්ථිර පදනමින් සිදු කරනු ලබන අතර, තෝරාගත් අයදුම්කරුවන්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ 2016.04.25 දිනැති අංක 02/2016 දරන චක්‍රලේඛය ප්‍රකාරව වන මූලික වැටුප් පියවර මත පිහිටුවනු ලැබේ.
- SLBFE ආයතනය විසින්, සේවක අර්ථසාධක අරමුදලට, සේවකයාගේ වැටුපෙන් 15% සමාන මුදලකින් දායක වන අතර, එයට අමතරව, සේවක භාර අරමුදලටද 3% ක දායකත්වයක් දරනු ඇත.

**දැනට ලබාදෙනු ලබන අනෙකුත් ප්‍රතිලාභ :**

- වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම, ණය මුදල් (ආපද, වාහන), නිවාස ණය සඳහා 2/3 ක ණය පොලී ප්‍රතිපූර්ණය සහ භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික ප්‍රසාද දීමනා ද ගෙවනු ලැබේ.

උනන්දුවක් දක්වන, ඉහත සඳහන් නිර්ණායක සපුරාලන අයදුම්කරුවන් විසින්, විස්තරාත්මක ජීව දත්ත ඇතුළත් අයදුම්පත්, සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන්, සභාපති, ශ්‍රී ලංකා විදේශසේවා නියුක්ති කාර්යාංශය, අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ලිපිනයට 2021.09.26 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත්, ඉහත ලිපිනය වෙත ගෙනැවිත් භාර දීමද කළ හැක. (රාජ්‍ය ආයතනවල, සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ)

අයදුම්පත් බහාලූ අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල.**
**දුරකථනය : 0112867599**
**www.slbfe.lk**

**Source: Silumina (2021.09.12)**